“සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) සලාතය ආරම්භ කරන විට ද රුකූඋ සඳහා අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසන විට ද තම දෑත් තම උරහිස ට සමාන්තර ව ඔසවන්නෙකු වූහ

ඉබ්නු උමර් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් වාර්තා කරන ලදී. “සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) සලාතය ආරම්භ කරන විට ද රුකූඋ
සඳහා අල්ලාහු අක්බර් යැයි තක්බීර් පවසන විට ද තම දෑත් තම උරහිස ට සමාන්තර ව
ඔසවන්නෙකු වූහ. රුකූඋවෙහි සිට තම හිස ඔස වන විට ද එලෙසම එතුමා තම දෑත් ඔසවා සමිඅල්ලාහු ලිමන් හමිදා රබ්බනා වලකල් හම්දු යැයි පැවසූහ." එතුමා සුජූද්හි එලෙස සිදු නො කළහ.
[صحيح] [متفق عليه]

සලාතයේ ස්ථාන තුනක තම දෙඅත් සමාන්තරව හෝ උරහිසට සමාන්තරව හෝ එතුමාණෝ එසවූහ. එනම්: උරහිසෙහි සන්ධිය හා බාහුව අතර පවතින කොටසයි. පළමු ස්ථානය: සලාතය ආරම්භ කරන විට, ආරම්භක තක්බීරය පවසන අවස්ථාවේ. දෙවන ස්ථානය: රුකූඋ ඉරියව්ව සඳහා තක්බීර් පවසන විට, තුන්වන ස්ථානය: රුකූඋ ඉරියව්වෙන් තම හිස ඔසවා "සමිඅල්ලාහු ලිමන් හමිදා රබ්බනා වලකල් හම්දු" යැයි පවසන විට. සුජූදය ආරම්භ කරන විට හෝ ඉන් නැගිටින විට හෝ එතුමාණන්ගේ දෙඅත් එසේ එසෙව්වේ නැත.

https://sunnah.global/hadeeth/si/show/3095